10/11/2010 - ලංකාදීප

**සමාජ විසමතා අවම කළ හැකි අනිවාර්ය ජාතික සේවාව - මිලින්ද මොරගොඩ**

අතිශය දරුණු, දරාගත නොහැකි සිදුවීම් බහුලව පැවති කාලපරිච්ඡේදයක් අතීතයට එකතුවිය. මිනිසුන් හා ජීවිත විනාශ කළ, ත්‍රස්තවාදය අවසන් කිරීම සාමාන්‍ය සමාජයට මහත් අස්වැසිල්ලක් ගෙන ආවේය. අමිහිරි සිදුවීම් අමතක කිරීමෙන් පසු සැනසිලිදායක යුගයක් කෙරෙහි අප සියලු දෙනා සිටින්නේ අපේක්ෂා සහගතවය. එනමුත් ගැටුම් හා රෞද්‍රභාවය තැනින් තැන මතුවෙමින් පවතී. නපුරු, විනය පිරිහී ඇති බවක් තරුණ සමාජයේ පෙනේ. බුද්ධිමත් හා සිද්ධියක් ගවේශනයකර මැදිහත්ව තීන්දු ගතහැකි තැනක් ලෙස ගැනෙන විශ්ව විද්‍යාල පද්ධතියට රුධිරය හා කඳුල මුසු වී තිබේ. අධ්‍යයනය වෙනුවට දේශපාලනය කෙරෙහි පළමු තැනක් දෙන්නට එහි සිසු දරුවන් තීරණය කර ඇත්තේ ඇයි?

පාසල් අධ්‍යාපනයෙන් පසු විශ්ව විද්‍යාලයට ඇතුලත් වන්නට වරම් ලබන්නේ හොඳ දැනුමක් ඇති අවබෝධයක් ඇති කණ්ඩායමකි. එම පිරිස විශ්ව විද්‍යාල අධ්‍යාපනයට සුදුසුකම් ලැබුවේ බෙහෙවින් වෙහෙසී, කැපවීමෙන් ලැබූ අධ්‍යාපනයෙහි ප්‍රතිඵලයක් වශයෙනි. තරුණ අවධිය සමාජය දෙස අලුත් ඇසකින් බලන්නට හුරුවෙන කාලයයි. සමාජ ප්‍රශ්න හා ඒවාට විසඳුමක් දෙන්නට උනන්දු නොවෙන බව දැනෙන විට පාලන ක්‍රමය ගැන නොයෙකුත් අදහස් මේ තරුණ සිත්වල ජනිතවන බව නිසැකය. ආවේග හටගන්නේ එවිටය. එනමුත් පවතින ප්‍රජාතන්ත්‍රවාදී රාමුව විනාශකර එහි ඇති සංස්කෘතිය හා විනය අභියෝගයට ලක් කර සමාජ ගැටලු විසඳුම් සොයන්නට යාම අනුවනකමකි. ලංකා විශ්ව විද්‍යාලය නමින් පේරාදෙණියේ මෙරට පළමුවෙන් උසස් අධ්‍යාපන ක්‍රමය ආරම්භවූයේ ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස්ගේ ප්‍රධානත්වයෙනි. ඔහු එහි පළමු උප කුළපතිවරයා විය. ඒ අවධියේදීත් ශිෂ්‍ය ව්‍යාපාර තිබුණි. වරක් තමන් මුහුණපාන ප්‍රශ්න ගැන විරෝධතා දැක්වූ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පළමු ශිෂ්‍ය කණ්ඩායම උප කුළපතිවරයා හමුවට පෙළපාලියකින් පැමිණෙන විට ඔහු කියා ඇත්තේ ''ඔබගේ ක්‍රියා රටේ නීතිය උල්ලංඝනය කරන නමුත් අපි කෝපි කෝප්පයක් බී මේ ගැන කතා කරමු'' යනුවෙන් බව ඉතිහාසය කියයි. එය දෙපැත්තටම කතා කරන්නට දෙයක් ඇති බව හා ආවේගශීලී නැති කතාබහකින් ගැටලු විසඳාගත හැකි බව පෙන්නවන කදිම සාක්ෂියකි. ශිෂ්‍යයන්ටත්, විශ්වවිද්‍යාල පාලකයින්ටත් සීමා තිබේ. ඒවායේ පරිපාලන රටාවක් ඇත. එපමණක් නොවේ සාමාන්‍ය ජනතාවට හිරිහැරයක් වන හා දෙමාපියන්ගේ අරමුණු විනාශ කරන අන්දමට හැසිරීමට කිසිවෙකුට අයිතියක් නැත.

විශ්ව විද්‍යාලය තුළ ප්‍රකෝපකාරීව හැසිරෙන පිරිසක් පමණක් නොව සාමාන්‍ය සමාජයට නොගැලපෙන අන්දමට නවක සිසුන්ට වධ දෙන අවස්ථා ද වාර්තා වෙයි. අලුතින් විශ්ව විද්‍යාලයට ඇතුලත් වන සිසුන් ට නවක වධයක් දෙන්නේ ඇයි? විවිධ සමාජ පසුතල වලින් හා විවිධ අධ්‍යාපන රටාවලින් තෝරා ගන්නා සිසු සිසුවියන් පොදු කුලකයකට ඇතුලත් කර ගැනීම එහි අදහස වී තිබේ. එකම දරු කැළක්, එකම අරමුණක් ඇති සහෝදර පිරිසක් යන බැම්මෙන් සියලු දෙනා එකමුතුවීම වැදගත් කරුණකි. මේ එකමුතුබව ඇති කරන්නට විශේෂිත සංකල්ප ක්‍රියාත්මක කිරීම අයෝග්‍ය නැත. ලෝකයේ එවැනි අවස්ථා ඕනෑ තරම් සිදුවෙයි. එනමුත් මේ නවක වධය කායික හා මානසික හිංසාවක් විය යුතු නොවේ. දැනට වාර්තා වෙන හා වේගයෙන් පැතිර යන සිද්ධීන් ගැන විමසනවිට විශ්ව විද්‍යාල පද්ධතිය තුළ නවක වධය අමානුෂික මුහුණු වරක් ගෙන තිබේ. පාසල් පද්ධතියේ ඉහළ ශ්‍රේණිවලට ද එය කාන්දු වී ඇත. රටේ අනාගතය භාර ගන්නාට සිටින තරුණ පරපුර එක පැත්තකින් උද්ඝෝෂණ කරමින් නපුරු ලෙස හැසිරෙන අතර නවක ශිෂ්‍ය කණ්ඩායම් ඉදිරියේ අමානුෂික අන්දමට නවක වධයට පෙළැඹෙන්නේ නම් සතුටු විය හැකිද?

ඇමෙරිකාවේ හිටපු ජනාධිපතිවරයෙකු වූ ජෝන් ඇඩම්ස් මහතා පළ කළ අදහසක් යළි සිහිපත් කිරීම වටී. ඔහු එරට දෙවැනි ජනාධිපතිවරයා විය. ඒ අදහස තුළ ගැබ්ව ඇති අර්ථය පුලුල්ය.

ජෝන් ඇඩම්ස් මහතාගේ ප්‍රකාශය මෙයයි. "I studied war and politics so that my sons can study economics and commerce, so that their sons can study poetry and music". එය සිංහලට ගතහොත් අරුත වන්නේ අනාගතය පිළිබඳ දර්ශනයකි. '' මම යුද්ධය හා දේශපාලනය හදාරමි. ඒ මගේ දරුවන්ට ආර්ථිකය හා වෙළඳාම උදෙසාය. දරුවන්ගේ දරුවන් ට කාව්‍ය හා සංගීතය හදාරන්නට එයින් හැකි වනු ඇත.'' යනු එහි සරල පරිවර්තනයයි.

අවුරුදු තිහක් තිස්සේ අභ්‍යන්තර යුද්ධයක් පැවති ශ්‍රී ලංකාවේ ආර්ථිකය ශක්තිමත් කිරීමේ අවස්ථාව දැන් උදා වී තිබේ. ඉනික්බිතිව අනාගත පරපුරට ගෞරවණීය ජීවිතයක් ගත කළ හැකි වනු ඇත. සමාජ පරිවර්තනයකට ඉක්මන් ගමන් නැත. එය සිදු විය යුතු පියවරෙන් පියවර ඉදිරියට ගමන් කිරීමෙන් පමණකි. මැතිවරණ දින දර්ශනය ශ්‍රී ලාංකේය සමාජයේ කා වැදී ඇති ලක්ෂණයකි. ඊළඟ මැතිවරණයට පෙර සියලු ප්‍රශ්න විසඳීම නායකයන් ගේ අපේක්ෂාවයි. මේ උදෙසා මහජනතාව තුළ බලාපොරොත්තු ඇති කරවයි. එසේ කරන්නේ තමන්ට බලය ලබා ගැනීමේ අරමුණ ඇතිවය. මේ අරමුණ ඇතිව අපේක්ෂා දල්වමින් කරන ප්‍රකාශ නිසා සමාජයේ අද්වේගය වැඩිවෙයි. සියලු දුක් දොම්නස් නැති කරන්නට දේශපාලන පක්ෂ වලට හැකි බව සිතන්නට පටන්ගනී. එනමුත් යථාර්ථය එය නොවේ.

මෙරට පවතින දේශපාලනය අනුව අවස්ථාව ලැබෙන්නේ පාක්ෂිකයන්ට යැයි මහජනතාව සිතයි. සාධාරණ අවස්ථා හිමිවන්නේ සීමිත පිරිසකට පමණකි. පාසලට දරුවෙකු ඇතුලත් කරගැනීමේ සිට සුසාන භූමියේ ඉඩක් වෙන්කර ගැනීම දක්වා දේශපාලනය වැදගත් වී තිබේ. දේශපාලනඥයාගේ පිහිට පැතිය යුතුය. බලයට පත්කරන දේශපාලනඥයාගෙන් එකී අවශ්‍යතා ඉටුනොවෙනවිට හා අඩුම තරමින් තමන් අත්විඳි අමිහිරි තත්ත්වයට විසඳුමක් නොලැබෙන බව පෙනෙනවිට තමන් බලයට පත් කළ දේශපාලනඥයාට හෝ දේශපාලන පක්ෂයට වුවත් එරෙහිව වීදි බසින්නට සමාජය සූදානම්ය. ඉක්මන් විසඳුම් අපේක්ෂා කරන හෙයින් බලයට පත්වන ආණ්ඩුවක් අවුරුද්දක් දෙකක් යන විට පිරිහෙයි. අසාර්ථක නායකයින් බව කියන්නට පටන් ගනී. තමන් පත් කළ නායකයින්ට ම නිග්‍රහ කරන්නටත්, ඔවුන් ජාවාරම්කාරයින් හා සමාජ විරෝධීන් සේ සලකා දොස් තබන්නටත් පටන් ගනී. මැතිවරණයක් අවස්ථාවේ සමාජයේ වීරයන් වූ පුද්ගලයන් වැඩි දිනක් යන්නට කලින් පාගා බිම දමන සමාජයක් ඔවුන්ගෙන් ම ශ්‍රී ලංකාව දියුණු කිරීම ගැන සිහින දැකීම යථාර්ථයයි. මේ අඩු ලුහුඬුකම් වලට මුල සමාජ බෙදීමයි. ජාතිය, ආගම, කුළය, දේශපාලනය හා අධ්‍යාපනය ලැබූ පාසල ආදී වශයෙන් සමාජයේ වෙනම බෙදීම් පවතී. ශ්‍රී ලාංකේය එකමුතු බව අඩුය. සමාජයේ එකමුතුකමක් නැති නිසා රටේ දියුණුවට එය බලපා තිබේ.

අද රටට අවශ්‍යව ඇත්තේ යුක්තියයි. සාධාරණත්වයයි. සාධාරණ අවස්ථා ඇති සමාජයක පුරවැසියන්ට වෙනත් අනුග්‍රහ අවශ්‍ය නැත. ඔබ ඔබෙන් ම ප්‍රශ්න කරන්න. ඔබේ දක්ෂතාවය වෙනුවට දේශපාලන මැදිහත්වීමකින් අවස්ථාව අහිමිවන බව පෙනෙන විට ඇතිවන වෛරය කොතරම් දරුණු එකක් ද? නිදහස ලැබූ දා පටන් මේ රටේ දේශපාලන පක්ෂ විසින් ෆ්‍රින හෝ නොෆ්‍රින මෙම වෛරය වපුරා තිබේ. අප සියලුම දෙනා එහි කොටස්කරුවන්ය. මෙම වෛරය කාලයෙන් කාලයට පුපුරා යයි. එක්දහස් නමසිය හැත්තෑ එකේ කැරැල්ල එහි එක් අවස්ථාවකි. දකුණේ කකියන තරුණ රුධිරය මෙම කැරැල්ලේ දී රටට අහිමි විය. එහිදී බිළි වූයේ එඩිතර යමක් දෙස වෙනස්ව බලන්නට හැකි තරුණ කණ්ඩායමකි. රට ගොඩනගන්නට දායක කරගතහැකි වූවා නම් විශිෂ්ටයන් බවට පත් විය හැකිව තිබුණ නායකත්වයයි. දිවි පිදූ තරුණන්ගේ රුධිරයෙන් පැවති ක්‍රමය තවත් කාලයකට ආරක්ෂා විය. දෙවැනි කැරැල්ල හා ඉන් පසු ඇති වූ එල්. ටී.ටී.ඊ ත්‍රස්තවාදය ඉහල නැගෙන තරුණ ආවේගවල ප්‍රතිඵල බව සඳහන් කළ යුතුය. පරම්පරාවක් විනාශකර, ඔවුන් මතුකරන ජවය යටපත්කර පවතින දේශපාලනය වෙනුවට සමාජ සාධාරණත්වය තුළින් අභියෝග ජයගන්නා ක්‍රමයක් අපට අවශ්‍යය.

එය කළ හැක්කේ කෙසේද? ජාත්‍යන්තරයෙන් පාඩම් ඉගෙන ගැනීමට නොහැකිද? ශ්‍රී ලංකාවේ පමණක් නොව ලෝකයේ කොතැනක වුවත් ක්‍රමයට එරෙහිව බලවේග මතුව තිබේ. සාධාරණත්වය හා සමාන අවස්ථා අහිමිවන බව පෙනෙන විට එයට එදිරිව ප්‍රචණ්ඩත්වය මතුවෙයි. මර්දනය පහසුය. එහෙත් එය තාවකාලිකය. දැන් පෙනෙන ආකාරයට රටක නායකත්වය විශ්වාස නොකරන කොටසක් සමාජයේ සිටියි. ඔවුන්ට හැම දෙයක්ම වැරදිය. ලාංකේය ප්‍රජාතන්ත්‍රවාදය අනුව මෙරට විපක්ෂයේ කාර්ය භාරය වී ඇත්තේ ආණ්ඩුවේ ඕනෑම අදහසකට විරුද්ධවීමයි. යහපත් දේ වෙනුවෙන් උදව් කරන අයහපත දැක එය වෙනස් කරන්නට වෙහෙසෙන විරුද්ධ පක්ෂ දේශපාලනයක් රටට නැත. මේ හෙයින් සමාජයේ අන්තවාදී කොටස මෙවැනි ඕනෑම දෙයක වැරැද්ද දකින ක්‍රමයක් සමාජය තුළ නිර්මාණය වී ඇති බව නිසැකය. ආපසු හැරී බලන විට වර්තමාන පරපුර විසින් අනාගතයට කලාව හා සාහිත්‍ය විඳින නිදහස් සාමකාමී අවස්ථාවක් බිහි කරනු ඇතිද? විශ්ව විද්‍යාලය තුළ ප්‍රචණ්ඩත්වය බහුල වන විට එය මර්දනය කරන්නට පොලිසිය හෝ හමුදාව මැදිහත්වන විට රටක අනාගතය කුමක්ද? ශිෂ්‍ය කල්ලි ඇතිවී ගැටෙමින් තමතමන්ගේ අනාගතය අඳුරු කරගනිමින් ලැබිය හැකි අවස්ථාව කුමක්ද? ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ප්‍රශ්න විසඳාගත යුත්තේ සාකච්ඡාවෙන් හා සංවාදයෙනි. වර්තමානයේ රටේ අභියෝගය විය යුත්තේ එයයි. සමාජයේ ප්‍රශ්නයක් සමාජය විසින්ම එකතු වී විසඳා ගැනීමට නම් ඒ වෙනුවෙන් යළි පසුබිම සකසා ගැනීම අවශ්‍ය කාරණාවකි.

මේ අවස්ථාව ඇති කර ගන්නට සමාජයේ එකමුතුබව වැදගත්ය. ශ්‍රී ලාංකිකත්වය හා ජාතික අනන්‍යතාවය යළි මතු කර ගැනීම අවශ්‍යය. දීර්ඝ කාලයක් ගැටුම් පැවති ඒ නිසා සමාජය අවුල් වූ අවස්ථාවක බේධ පසෙකලා එක අරමුණකින් රට ගැන හිතන්නට හැකි පසුබිමක් බිහි කිරීම අප සියලු දෙනාගේ වගකීමකි. එය කළ හැක්කේ කෙසේද? අනිවාර්යය ජාතික සේවය එයට ගැලපෙන එක් මාවතක් බව සඳහන් කළ හැකිය. එමගින් සමාජයේ පවතින බෙදීම් හා පරස්පරතා අවම කර ගත හැකිය.

සිංගප්පූරුව දියුණු කරන අවස්ථාවේදී ලී ක්වාන් යූ මහතා සමාජයට අනිවාර්යය ජාතික සේවය නියම කළේය. ස්විට්සරලන්තය, ඊශ්‍රායලය වැනි රටවල අදටත් අනිවාර්ය ජාතික සේවය පවත්වාගෙන යයි. මෙයින් සමහර රටවල එය යුධ පුහුණුවකි. අනිවාර්ය පුහුණුවක් මගින් ස්වදේශිකත්වය හා සමානාත්මතාවය සම්බන්ධ මූලික සංකල්ප ජන හදවත් තුළ වගා කරවයි. මෙරට පාසල් පද්ධතිය තුළ වෙනස් අන්දමකින් මෙවැනි පුහුණුවක් ක්‍රියාත්මක වෙයි. ශිෂ්‍ය භට ව්‍යාපාරය එයයි. එහෙත් එය පැතිරුණ, සමස්ථ ශිෂ්‍ය ප්‍රජාවටම අත්දැකීම් ලබා දෙන වැඩ සටහනක් නොවේ. ශිෂ්‍ය භටයන් වශයෙන් පුහුණුව ලබන සිසුන් තම ශිෂ්‍ය ජීවිතයේ දීම දුෂ්කරතා විඳී. පොදු අරමුණකින් අභියෝග ජය ගැනීමට එකතු වෙයි. තරඟකාරීත්වය සහ සාමූහිකත්වයෙන් ක්‍රියා කිරීමෙන් ලබා ගත හැකි ජයග්‍රහන ගැන අත්දැකීම් ලබයි. එවැනි ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇති දරුවන්ගේ ජීවිත සාර්ථකත්වට පත්වෙයි.

යුධ පරිසරයක් නොතිබුණ සිංගප්පූරුව සමාජයේ සියලුම දෙනා එකම තැනකට ගෙන එන්නට ජාතික සේවය උපයෝගී කර ගත්තේ ජාතික ව්‍යාපෘතියක් වශයෙනි. ආරම්භක අවස්ථාවේ සියලු තරුණන් අනිවාර්යය ජාතික සේවයට යොමු කරන්නට සිංගප්පූරු දෙමාපියන් ඔවුන් කැඳවාගෙන ආවේ යුද්ධයට යවන්නට සුදානම් කරන්නාක් මෙනි. හඬමින්, කඳුලු සලමින් දරුවෝ කඳවුරට බාරදෙන ලදහ. නමුත් අද වන විට එහි අනිවාර්ය ජාතික සේවය රටට ශක්තිමත් පදනමක් සකසා තිබේ. විනය, ආචාරශීලීත්වය හා රට ගැන ඇති කැක්කුම අතින් ඔවුන් ඉහලය. ඊශ්‍රායලය ජාත්‍යන්තර තලයේ විශාල පෙරැළියක් කළේ මෙම අනිවාර්ය ජාතික සේවාව යුධ පුහුණුවක් වශයෙන් ලබා දීමෙනි. එරට කාන්තාවන්ට පවා මැෂින් තුවක්කුවෙන් වෙඩි තැබීමේ පුහුණුව ඇත. පුහුණුව සමග ශික්ෂණය ද ඇති නිසා තුවක්කුව අතට හුරු නමුත් ඝාතන සංස්කෘතිය මතු වී නැත. බුද්ධාගම, හින්දු, ඉස්ලාම් හා කිතුණු ආගම් වලින් ශික්ෂණය ලබා ඇතත් ශ්‍රී ලංකාවේ ඝාතන සංස්කෘය හා අවි ආයුධ පරිහරණය ගැන අපට ඇත්තේ භීතියක් නොවේද?

ජාතික සේවය මගින් සිංගප්පූරුවේ ඇති කළේ හැඟීම් සහ ආකල්ප වෙනස් කිරීමයි. රට වෙනුවෙන් කැපවන බවට ජාතික හැඟිම ඇති කිරීමයි. එය සාර්ථක විය මගේ රට, මගේ දේශයේ උන්නතිය වෙනුවෙන් කැපවීම වැනි ආකල්ප සිංගප්පූරුව වැනි භාෂා රුසක් කතා කරන විවිධ ජාතීන්ට අයත් සමාජයකට හුරු වූයේ මේ ජාතික සේවය වැඩ සටහන සමගය. එතැනට පැමිණෙන තරුණ පිරිස අතර දුප්පත් පොහොසත් බේධ නැත. විනය හා ශික්ෂණය ජනිත කරවයි. හැම දෙයක්ම කරන්නේ ක්‍රමානුකූලවය. සමාජයේ පෙලැන්ති අනුව හෝ බලය ඇති තරම අනුව ජාතික සේවයේ වරප්‍රසාද දිනා ගත නොහැකිය. සමානාත්මතාවය හා සියලුම දෙනාට ඇත්තේ එකම අවස්ථාව බව එමගින් සමාජයකට ඒත්තු ගියේය. ආසියාවේ සහෝදර රටක් එයින් අත්දැකීම් ලබා ඇති විටෙක අපේ සමාජයට ද හඳුන්වාදීම අපහසු නැත. ත්‍රස්තවාදයෙන් රට නිදහස්ව ඇති විටෙක රටේ තැනින් තැන කඳවුරු ඇති කළ හැකිය. විවිධ පළාත් වලින් රටේ නොයෙකුත් තැන් වලට ගොස් පුහුණුවක් ලබමින් කාල සටහනකට අනුව වැඩ කරන්නටත් සංවර්ධන වැඩ සටහන් වලට තරුණ ශ්‍රමය දායකකරන්නටත් හැකි වනු ඇත. මුලින් ද සඳහන් කළ පරිදි තරුණ සමාජයේ ඉහල පෙලේ විද්‍යාල නම් අනුව කුලක බිහිවී තිබේ. දැන හැඳුනුම්කම් ඇත්තේ ඔවුනොවුන් අතරය. මෙවැනි බාධාවන්ට එයින් ඉඩ ඇවිරෙනු ඇත. සමාජ තල අතර සම්බන්ධතා ඇතිවී විවිධ සමාජවල පවතින නොයෙකුත් අදහස් සම්මිශ්‍රණය වෙයි. ප්‍රශ්න හඳුනාගැනීමටත් ඒවාට තරුණන් වශයෙන් විසඳුම් යෝජනා කිරීමටත් ඉඩ සැලසෙයි. මෙවැනි ජාතික සේවා වැඩ සටහන් සියලුම දෙනාට අනිවාර්ය කිරීම වැදගත්ය. යම් වයස් සීමාවකට පැමිණි පසු උසස් පහත් දුප්පත් පොහොසත් බේධයකින් තොරව රටේ නායකයාගේ සිට දිළින්දාගේ දරුවා දක්වා එකට වැඩී, එකට වෙසෙන කාලපරිච්ඡේදයක් මේ මගින් ඇති කළ හැකිය. දැනට මෙම අනිවාර්ය ජාතික සේවය පවතින රටවල එවැනි පුහුණුවකින් වැලකිය හැකි වෛද්‍ය නිර්දේශ අනුව සහභාගී නොවන්නේකුට පමණකි. එය ඒතරමට දැඩි විනයක් හා සියලු දෙනාම සහභාගී විය යුතු අනිවාර්ය යුතුකමක් සේ සැලකෙන ජාතික ව්‍යාපාරයකි.

එවැනි ජාතික සේවාවක් හෝ අනිවාර්යය පුහුණුවක් සඳහා ආණ්ඩුවකට ආයෝජනය කරන්නට සිදුවන මුදල විශාලය. ශ්‍රී ලංකාව වැනි දියුණු වෙමින් පවතින රටකට එය දරා ගත නොහැකි තරම් විය හැකිය. නමුත් වර්තමානයේ සමාජය තුළ දක්නට ලැබෙන බෙදීම් හා රට වෙනුවෙන් කැපවීම සම්බන්ධයෙන් ඇති දුර්වලතා දකින විට මෙවැනි ආයෝජනයක් අපතේ යා නොහැකිය. සරසවි ශිෂ්‍යයන් දඬු මුගුරු ඇතිව සටන් කරන විට, ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් ඇති ආයතන වටලා අභියෝග කරන විට මෙවැනි මෙහෙවරක් රටට අවශ්‍ය බව අවිවාදිතය.

මෙම අනිවාර්ය ජාතික සේවාවක උවමනාව මෙරටට ගැලපෙන බව දක්වන්නට සිදුවූයේ දරුණු අදහස් වලින් වර්තමාන පරම්පරාව මුදවා ගැනීමේ මාවතක් හැටියටය. මේ වැනි උපායක් අනුගමනය නොකරන තාක් කල් මේ පවතින ආක්‍රමණික අදහස් හෝ සමාජයේ ප්‍රශ්න සම්බන්ධයෙන් එකඟතාවයක් නැති බව තව දුරටත් හානි දායක ලෙස පුලුල් වීම නොවැලැක්විය හැකිය.

මේ අලුතින් සිතන්නට අවස්ථාවකි. පවතින සමාජය වැරදි මගක යන බව දැනේ නම් එය නිවැරදි මාවත කරා ගෙන යන්නට ඇති අවස්ථා ගැන සොයා බැලීම අපගේ වගකීමකි. අනිවාර්යය ජාතික සේවය ඒ වෙනුවෙන් ඇති එක් යෝජනාවක් පමණකි. එයට එකඟ නොවෙන හා වෙනත් වැඩ පිළිවෙලක් මගින් මේ පවතින වහා දුරු කළ යුතු පරිසරය වෙනස් කළ හැකි බව විශ්වාස කරන පිරිස් සිටිය හැකිය. ඔවුන් ස්වකීය අදහස් ඉදිරිපත් කළ යුතුවේ. තව තවත් නැවුම් අදහස් එකතු වන විට ඒ වා ගැන නොයෙකුත් සංවාද ඇතිවන විට රටේ නායකයන්හට තීන්දු ගැනීම පහසුය. විවෘතව පවත්වන සංවාදයක් මගින් මේ වෙනුවෙන් දර්ශනයක් සකසා ගැනීම අදහසක් අපට තිබිය යුතුය. රටේ දූ දරුවන්ගේ හා අනාගතයේ ආරක්ෂාව හෝ ත්‍රස්තවාදය මර්දනය වැනි පියවර මගින් පවතින තත්ත්වය පාලනය කිරීමට ආණ්ඩුව උත්සාහ කරන තෙක් අප බලා සිටිමුද? තමන්ට නැතිනම් වෙන කාටවත් තැනක් ගන්නට බැරිවන අන්දමට ක්‍රමය විනාශ කිරීමට අත්තනෝමතික අදහස් දරන සුළු පිරිසකට ඉඩ දිය හැකිද? එවැනි විනාශ වලක්වා ගැනීම ශ්‍රී ලාංකේය අප සියලු දෙනාගේ ම

වගකීමකි. ඒ වගකීම ඉටුකිරීම සඳහා සමස්ථ සමාජයම සූදානම්ද ? ඔබ ඔබගෙන්ම විමසා බැලිය යුතු එයයි.